**ශීර්ෂය 123 - නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 123 - නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 24 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 6,359.88 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 6,319.79 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 40.09 ක් හෙවත් සියයට 0.63ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 643.19 | 628.68 | 14.51 | 2.26 |
| මූලධන | 5,716.69 | 5,691.11 | 25.58 | 0.45 |
| **එකතුව** | **6,359.88** | **6,319.79** | **40.09** | **0.63** |

**2.2** **අත්තිකාරම් ගිණුම**

**2.2.1** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 12301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 15.00 | 7.69 | 7.00 | 8.39 | 50.00 | 22.39 |

**2.3** **අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0397/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 63.76 ක් වී තිබුණි.

**2.4** **පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 0.43 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0078/000 | 0.02 |
| 6000/0000/00/0002/0106/000 | 0.37 |
| 6000/0000/00/0013/0071/000 | 0.03 |
| 6000/0000/00/0015/0079/000 | 0.01 |
| **එකතුව** | **0.43** |

2.5 **විගණන නිරීක්ෂණය**

**----------------------**

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**----------------------------------------------**

**3.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**----------------------------------------**

විෂය අංක 12301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟහිටි ශේෂවල එකතුව රු.799,878 ක්වූ එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ණය ශේෂ 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

3.2 **කාර්යසාධනය**

**---------------**

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශය ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අඟුලාන අදියර 2 ව්‍යාපෘතිය සහ දිරිය පියස ව්‍යාපෘතිය 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. නමුත් එම ව්‍යාපෘති සඳහා පිළිවෙලින් රු.මිලියන 189.47 ක් හා රු.මිලියන 176.69 ක් අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි.

(ආ) 2015 වර්ෂයේදි නගමු පුරවර වැඩසටහන යටතේ රු.මිලියන 376 ක් ඇස්තමේන්තු කර නිවාස 6,349 ක් අළුත්වැඩියා කිරිමට සැලැසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ තොරතුරු අනුව රු.මිලියන 365.29 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 97 ක් වැය කර, සියයට 51 ක භෞතික ප්‍රගතියක් පමණක් ලබා ගෙන තිබුණි. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ තොරතුරුවලට අනුව අළුත්වැඩියා කර තිබු නිවාස 1,305 ක් හෙවත් අපේක්ෂිත නිවාස සංඛ්‍යාවෙන් සියයට 21 ක් පමණක් වී තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදි සෙවන සරණ නිවාස ව්‍යාපාතිය යටතේ නිවාස 5,000 කට ආධාර කිරිමට සැලැසුම් කර තිබුණද, නිවාස සංවර්ධන අධිකාරීයේ තොරතුරු අනුව නිවාස 316 ක් පමණක් ඉදිකර තිබුණි. සෙවන විශේෂ ආධාර ක්‍රමය යටතේ 2015 වර්ෂයේදී නිවාස 2,500 කට ආධාර කිරිමට සැලැසුම් කර තිබුණද, නිවාස සංවර්ධන අධිකාරියේ තොරතුරු අනුව නිවාස 08 කට පමණක් ආධාර කර තිබුණි. රජයේ හා පෞද්ගලික දායකත්වය යටතේ පල්ලේකැලේ ප්‍රයිම් ලැන්ඩ් වතුයාය සඳහා නිවාස 39 ක් ඉදිකිරිමට සැලැසුම් කර තිබුණද, කිසිදු නිවාසයක් ඉදිකර නොතිබුණි.

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 25 | 04 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 107 | 93 | 14 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 44 | 39 | 05 | - |
| | **එකතුව** | **182** | **159** | **25** | **02** |